

# කුරුප්පු සර්






සිසිර දිසානායක

"ලොකු හිදැසක් !" පන්හිඳ තමන්ටම කියා ගත්තා.

"කුරුප්පු මහත්තයා නැති වුණ එකනම් ලොකු අඩුවක් තමා" පින්සලත් ඇදේ ඉඳගෙනම පන්ට එකතු වුණා.

"හැබැයි ඉතින් සමහරුන්ට නම් දැන් ඉතින් සමහරුන්ටනම් දැන් ඉතින් නින්ද යාවි!" පැන්සල කතාවට එකතු වුණේ වෙනම විදියකට.

"ඇයි ? අයුක්තිය, අසාධාරණය, වැරැද්ද දැක්කම ඒවා පෙන්නලා පොත් පත්වලට ලියන හන්දද ?

"ඒ වුනාට කුරුප්පු මහත්තයා ලිව්වෙ පෞද්ගලිකව රිදවන්න නෙවෙයි කියලයි මට හිතෙන්නෙ." පින් සාධාරණීකරණය කළා.

"කුරුප්පු මහත්තයා ගැන තොරතුරු ටිකක් දැනගත්තොත් ලියන්න පුළුවන් "සන්නස"ට. පන්ට නිකමට හිතුනා.

"ඒ මේ වෙලාවේ ඒක අපේ යුතුකමක්." ප්‍රසන්න සිල්වා මහත්තයට කතා කළානං හොඳ තොරතුරු ටිකක් කියාවි. ඒ මහත්තයා ඉස්කොලෙ යන කාලෙ ඉඳන් ම කුරුප්පු මහත්තයාව ගුරුවරයෙක් විදියට දන්නවනේ." ඒ පින්.

"අනික කුරුප්පු මහත්තයාගේ අන්තිම දවස් ටික වෙනකල්ම ආව ගිය, හොයා බලපු ළඟින් හිටපු හොඳ ගෝලයෙක්නේ ප්‍රසන්න මහත්තයා. ඒ වගේ කිසි දෙයක් බලාපො- රොත්තු නො වී අවංකව කුරුප්පු මහත්තයාට ළං වෙලා උන්න කෙනෙක් මො- නවද කියන්නෙ කියන එක කාටත් වටිනවා." පන් තමන්ගේ ඉස්කෝලේ ජ්‍යේෂ්ඨයෙක් වෙන ප්‍රසන්න මහත්තයට කතා කළා.

"කුරුප්පු සර්ගෙන් මම පංතියේ පාඩම් ඉගෙනගෙන නෑ" ප්‍රසන්න මහත්තයාගේ බර සාර හඬ දුරකතනයෙන් එහා කෙළවරිනක් ඇහුණා.

"ඒත් පංතියෙන් පිට ඉගෙන ගත්ත පාඩම් නම් බොහෝමයි." කොළඹ ආනන්ද විද්‍යාලයේ නේවාසිකාගාරයේ මම ඉන්න කාලේ කුරුප්පු සර් නවාතැන් අරගෙන හිටියෙත් එතන දරුවන්ට වෙන් වුණ කොට- සෙයි. සර් ඉස්කෝලෙට ආවේ 1954 දි. එතකොට මගේ වයස අවුරුදු අටක් - නවයක් විතර ඇති." පන්ව ඒ අතීතයට ප්‍රසන්න මහත්තයා එක්ක ගියා.

"සර්ගේ මං දැකපු විශිෂ්ඨතම ගතිය තමයි කවුරුවත් පාවා නොදුන්න එක. ළමයෙක් වැරැද්දක්, දඟකාරකමක් කරනවා දැක්කම තමන්ගේ මට්ටමින් අවවාද කරලා ඒක කියා දෙනවා මිසක් තමන්ගෙන් ඉහළ ඉන්න අයට වාර්තා කරලා දඬුවම් පමුණුවන්න කවදාවත් හිතුවෙ නෑ. ඒකට හේතුවක් තිබුණා. දරු- වන්ගේ වැරදිවලට, දඟකාරකම්වලට අවවාද කළත් ඒවා කරන දඟයන්ගේ චරිතයට කුරු- ප්පු සර් ආදරය කළා. ඔය කාලෙට දඟ නොකරන්නෙ කවුද ?"

ප්‍රසන්න මහත්තයා හිනාවුණේ හරියට තමුනුත් ඒ කාණ්ඩෙම කෙනෙක් කියන එක නො කියා කියන්නා වගේ.

"කුරුප්පු සර් ඉස්කෝලෙ හිටියේ 1954 ඉඳන් 1958 වෙනකල් විතරයි. ඒ කියන්නෙ අවුරුදු හතරයි. ඒ වුණාට ඒ කෙටි කාලෙ කුරුප්පු සර්ගෙන් ඉගෙන ගෙන ගුරුහරුකම් ලබපු පිරිස බොහොමයි. පුදුමය කියන්නේ ඒ අය හැමෝම සර්ට ආදරෙයි. රට රටවල්වල ඉන්න ඒ අය අපි මෙල්බර්න් ඉන්නවා කියපු ගමන් අහන්නේ කුරුප්පු සර් ගැන."

"සර් ඉගැන්නුවෙ උසස්පෙළ ළමයින්ට සිංහල විෂයය. ඒ ශිෂ්‍යයෝ අතරේ මහාචාර්ය ජේ.බී. දිසානායක, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, ධම්මික අමරසිංහ, සුනිල් මාධව ප්‍රේමතිලක, යූ. විජේතුංග වගේ අය හිටියා. පන්තියෙන් පිට අපි වගේ ගුරු හරුකම් ගත්ත අය අතරෙ හමුදා ප්‍රධානියෙක් වුණ රොහාන් දළුවත්ත, ඉංජිනේරු සංස්ථාවේ සභාපති වෙලා හිටිය ආචාර්ය එච්. බී. ජයශේකර වගේ විශාල පිරිසක් ඉන්නවා. සර් 1958 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පෞද්ගලික සහකාර - (රාජ්‍ය භාෂා) තනතුර ලැබිලා ගියත් ටික කාලයක් අපේ නේවාසිකාගාරයේම සර්ව නවත්වාගන්න ඒ දවස්වල හිටපු විදුහල්පතිතුමා කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ මහත්තයා කටයුතු කළේ සර්ගෙන් ලැබුණ සේවය ගැන හිතලයි." ප්‍රසන්න සිල්වා මහත්තයා තමන්ගේ මතකය පන්ට කිව්වා. ඒ මහත්තයා කුරුප්පු මහත්තයා ගැන පැයක් ඇතුලත එකතු කරලා දුන්න තොරතුරු පන් මේ විදියට ලිපියකට ගොනු කළා.

ගොවිතැන් බතින් දිවි ගෙවූ කුරුප්පු ආරච්චිගේ පොඩි අප්පු මහත්මාටත් ගී කියනගේ ඇලිස් නෝනාටත් දාව වර්ෂ 1927 දෙසැම්බර් මස 26 දා මෙලොව එළිය දුටු දොන් බොල්වින් කුරුප්පු දරුවාගේ මුල්ම පාසල ගමේ පාසැලයි. කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලෑව විසූ ඔහු පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව හොරණ තක්ෂිලාවටත් උසස් පෙළ හැදෑරීමට කොළඹ නාලන්ද විද්‍යාලයටත් ඇතුලත් විය. ඔහු 1949 පේරා- දෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත්ව සිංහල, පාලි, ලංකා ඉතිහාසය, පරිපාලනය වැනි විෂ- යයන් හදාරාවසර 1953 දී ගෞරව උපාධියක් ලබමින් සිය උසස් අධ්‍යාපනය නිමා කළේය.

වර්ෂ 1954 - 1958 කාලයේ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආචාර්යවරයෙකු ලෙස සේවය කර වර්ෂ 1958 දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට ඩී.බී. කුරුප්පු මහත්මා ඇතුලත් විය. විද්‍යා විෂයයන් සිංහල බසින් ඉගැන්වීමට අවශ්‍ය පරිවර්තන කටයුතුවලදී එතුමා හට පැවරුණ කාර්ය භාරය අති මහත් විය. ඒ පෞද්ගලික සහකාර (රාජ්‍ය භාෂා) තනතුර දරමිනි. වසර 1961 සිට 1971 දක්වා සිමෙන්ති සංස්ථාවේ මහජන සම්බන්ධතා නිළධාරියෙකු ලෙස කටයුතු කළ සේවය, 1971 සිට 1986 දක්වා මහජන බැංකුවේදීන් කළ ඩී.බී. කුරුප්පු මහත්මා වසර 1986 සිට ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයේ උප- දේශකවරයෙකු ලෙසින් ද කටයුතු කළේය. වසර 1986 සිට 1989 කාලයේදී නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්‍ෂ තනතුරක් ද දරමින් අගනා සේවයක් කිරීමට ඒ මහත්මා ට හැකිවිය.

ලන්ඩන්, ඔස්ලෝ, ටෝකියෝ, නෙදර්ලන්තය, සිංගප්පූරුව වැනි රටවල සංචාරය කළ ඩී.බී. කුරුප්පු මහත්මා අවසන් කාලය ගෙවීමට තෝරාගත්තේ ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවරයි.

ඩී.බී. කුරුප්පු ලේඛකයාණන් සිය දිවියම ලේඛණයට කැප කලා සේය. වසර 1963 " මැංචෝසන් චාරිකා" නම් වූ පරිවර්තන කෘතිය එළිදක්වමින් ඇරඹූ ග්‍රන්ථ කතෘ භූමිකාව ජීවිතයේ මැදි වියේ පටන් දෑතින්ම තුරුළු කරගනිමින් මිය යන තුරුම ලිවීමට එතුමා උනන්දු විය. "මැංචෝසන් චාරිකා" දෙවන හා තෙවන මුද්‍රණද පිළිවෙලින් 1991 සහ 2005 වසරවල එළිදැකීම සැබැවින්ම ඒ වෙනුවෙන් වූ පාඨක ප්‍රතිචාර පිළිබඳව කියා පාන්නකි.

එමෙන්ම 1965 දී එළි දුටු "දැත්තාගෙයි යාළුවන්ගෙයි හපන්කම්" වසර 2003 දී දෙවන මුද්‍රණය ලෙසින් ද පිටවිය. ඒ ආහ්ලාදයෙන් දෝ ඩී.බී. කුරුප්පු ගත් කතුවරයා වසර 2004 දී "දැත්තා හඳට යයි" නමින් ද ග්‍රන්ථයක් එළි දැක්විය. විවිධ ක්ෂේත්‍රවලින් සිය දැණුමද එක් කරමින් එළි දැක්වූ ග්‍රන්ථ අතර වසර 1966 දී එළිදැක්වූ "හෝචිමිංගේ සිරගෙයි දිනපොත" වසර 2006 දී දෙවන වරටත් මුද්‍රණය විය. " අර්බන් දරුවො" පරිවර්තනය කාණ්ඩ හතක් ලෙස වසර 2010 දී එළිදැක්විණ.

සිංහල, ඉංග්‍රීසි දෙබසින්ම ලියූ ඩී.බී. කුරු- ප්පු වියනාණන්ගේ ඉංග්‍රීසි පොත් 13ක් එළිදැක්වී ඇත්තේය. ඒ අතර "පන්සිල්" නම් වන කෘතිය ද වෙයි. ආගම ඇසුරු කරගෙන ලියැවුණ ග්‍රන්ථ හය අතර " පන්සිල්" ග්‍රන්ථයේ සිංහල කෘතියද වේ. සෞඛ්‍ය පිළිබඳව ද ග්‍රන්ථ දෙකක් එළිදක්වා ඇති එතුමන් විප්‍රවාසී දරුවන් වෙත අපේ දේ ළං කර දෙනු වස් "කැකිල්ලේ", " මහදැනමුත්තා", සහ "අන්දරේ" චරිත ඇසුරින් ඉංග්‍රීසි බසින් ලියා ඇති ග්‍රන්ථ ද අගනේය. "බක්මහ උළෙල" වැනි අපේ කම පිළිබඳව ලියැවුණ ග්‍රන්ථ මෙන්ම මෙහි වෙසෙන ආදී වාසීන්ගේ කතා ඇතුලත් සිංහල ග්‍රන්ථයක් ද එළිදක්වන්නට එතුමා උත්සුක විය.

සංවාදාත්මකව ලියැවුණ "සිංගරු සිරිත", පිරිමි ජාතිය උතුම් ජාතිය, "ඉළපත - බාල්දිය - කොස්ස සහ පිරිත් නූල", "ලංකා- වක් වගේ පුංචි", "විප්ලවය ආවොත්" වැනි ග්‍රන්ථ සිය මතවාද මත පිහිටා ලියැවී ඇත්තේය. තවමත් මුද්‍රණයේ ඇති ග්‍රන්ථ ප්‍රමාණය හතක් පමණ වන අතර ඩී.බී. කුරුප්පු වියතාණන් එළිදක්වා ඇති මුළු පොත් ප්‍රමාණය පනස් හතරකි(54).

මේ සා කැපවීමකින් යුක්තව පාඨකයින් වෙනුවෙන් සිය දැනුමත්, අදහස් - උදහස් යනාදියත් ලියා තබන්නට අප අතරින් වෙන්වන තුරුම වෙහෙසුන දොන් බොල්වින් කුරුප්පු වියත් ලේඛකයාණන්ට අමා මහ නිවන් සුවය පතන්නෙමු !